මත්ද්‍රව්‍ය සඳහා යම් අයෙකු ඇබ්බැහි වීමක් පසුපස සංකීර්ණ කරුණු රාශියක් තිබිය හැක. එසේ වන විට මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් සරලවම මත්ද්‍රව්‍ය සඳහා වන ලොල් වීමක් බවට ලඝු කිරීම නිවැරදි නොවේ. ඒ මගින් මත්ද්‍රව්‍ය ඇබ්බැහිය යන සමාජ ගැටළුව සම්බන්ධයෙන් ඉදිරිපත් වන්නේ වැරදි පණිවුඩයක් නොවේදැයි අප ඇසිය යුතුවේ. එනිසා, මෙවැනි කරුණක් සම්බන්ධයෙන් පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී යොදාගන්නා භාෂාව පිළිබඳව මාධ්‍ය සැලකිලිමත් විය යුතුවේ.

ඊට උදාහරණ ලෙස පහත පුවත් වාර්තාවන් දැක්විය හැක. මව්බිම (01/01), අරුණ (02/01) සහ දිවයින (01/29) පුවත්පත් වල පළවූ විවිධ පුවත් වාර්තාවන්හි සිරස්තල තුළ "මත්ලෝලියා", "මත්ලෝලීන්" යන යෙදුම් අන්තර්ගතව තිබිණි. කෙසේ නමුත් මව්බිම (02/03) පුවත්පතේ වූ පුවත් වාර්තාවක සිරස්තලයේ දැක්වී තිබුණේ "මතට ඇබ්බැහි වූවන්" යන්නයි. මෙම සිරස්තල සියල්ල සැසඳීමේදී වඩාත්ම යෝග්‍ය වචන භාවිතාව වන්නේ "මතට ඇබ්බැහි වූවන්" යන්න බව අපට පිළිගැනීමට සිදුවේ.

එනිසා, 'මත්ලෝලීන්' වැනි යෙදුම් දිගින් දිගටම භාවිතා කිරීම සම්බන්ධයෙන් බොහෝ පුවත්පත් නැවතත් සිතා බැලිය යුතු බවත්, ඒ වෙනුවට 'මතට ඇබ්බැහි වූවන්' වැනි යෙදුම් භාවිතය යෝග්‍ය බවත් අපි මෙසේම පවසමු.

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbma #Divaina #Aruna